## කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

### <u>උපකුලපති තනතුර සඳහා අයදුම්පත්‍ර / නාමයෝජනා කැඳවීම</u>

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 (1) (a) වන වගන්තියේ සහ එහි තදනන්තර සංශෝධන නියමන් පරිදි කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් උපකුලපති තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් / නාම යෝජනා කැඳවනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව උපකුලපතිවරයා පූර්ණ කාලීන නිලධරයෙකු වන අතර, ඔහු එහි ප්‍රධාන විධායක හා ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා ද ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ද වේ. ඔහු නිල බලයෙන් පාලක සභාවේ හා සනාතන සභාවේ සාමාජිකයෙක් හා සභාපතිවරයා ද වේ.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 34 වගන්තියේ (7) උප වගන්තිය අනුව උපකුලපති තනතුරින් කලින් ඉවත් කළ හොත් මිස් සේවය අත්හැරිය හොත් හැර වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අතර, ඔහු / ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ උපකුලපති තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතු වේ.

උපකුලපතිවරයා අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති හඳුන්වා දීම හා පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වේ. ඔහු / ඇය විශ්වවිද්‍යාල සාමාන්‍ය පරිපාලන, අධ්‍යයන විශිෂ්ටත්වය, පාරදෘශ්‍ය භාවය, වගකීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල අපක්ෂපාතී නායකත්ව මූලධර්ම උත්පාදනය කළ යුතු වේ.

ප්‍රබල පර්යේෂණ පැති කඩක්, ප්‍රත්‍යක්ෂ නායකත්ව ගුණාංග හා විවිධ අභිරුචි කණ්ඩායම් සමඟ වාස්තවිකව ගනුදෙනු කළ හැකි අන්තර් පෞද්ගලික නිපුණතා, ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් හා තීරණ සඵල පරිදි ක්‍රියාත්මක කිරීමේ කැපවීම ඇතුළු උසස් ශාස්ත්‍රාලීය ජයග්‍රහණ වාර්තාවන් සාර්ථක අපේක්ෂකයා සතුව තිබිය යුතු වේ. ප්‍රජාව කෙරෙහි කැපවීම ඇතුළු විශ්වවිද්‍යාලයක ගුණාත්මක භාවය හා මෙහෙවර පිළිබඳව ගැඹුරු අවබෝධයක් ඔහු / ඇය සතුව තිබිය යුතුය. අයදුම්කරුවන්ට / නාම යෝජනා ඉදිරිපත් කරන අයට කැලණිය විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියට පිවිසීමෙන් මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර ලබාගත හැකිය *https://www.kln.ac.lk*.

උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ඉහළම වැටුප් තලයේ තැබීමට හිමිකම් ලබන අතර, මූලික වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාව, තනතුරට අදාළ අනෙකුත් දීමනා සහ ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ලබයි.

උපකුලපති තනතුර සඳහා නිර්දේශ කිරීම 2020.05.04 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක. 02/2020 හි සඳහන් කර ඇති මාර්ගෝපදේශ අනුව සිදු කෙරේ. මෙම මාර්ගෝපදේශය කැලණිය විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියේ ඇත.

අයදුම්කරුවන් / නාමිකයන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු හැට තුනට (63)ට අඩු විය යුතුය. අයදුම්පත්‍ර / නාම යෝජනා සමඟ පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය.

I. කැලණිය විශ්වවිද්‍යාලයේ අභිවර්ධනය සඳහා ස්වකීය දැක්ම පිළිබඳ මූලික ප්‍රකාශයක්, උපකුලපති තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඉටු කිරීමට යෝජිත කාර්යයන් පිළිබඳ කෙටි විස්තරයක්, සහ ඔහු / ඇයගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු (නම, උපන්දිනය, ලිපිනය, දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළුව) (Curriculum Vitae)



Page 1 / 2 Zoom 100%